පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

විෂයය:- පෙරදිග

මාර්තු 2

ශ්‍රේණිය :-

Prepared by- H.D.V.K.C.Ilangarathna
(Music Teacher:- Ke/Dehi/Gonagala K.V.

ස්වර ලිපි කියවීමේ ක්‍රම ශිල්ප

පෙරදිග සංගීතයේ ව්‍යවහාරික සංගීතයේ දී ස්වර ප්‍රස්ථාරයක් වාදනය කිරීමේදී අත්‍යාවශ්‍ය කරුණක් ලෙස ගීතය හෝ වාදිතය ප්‍රස්ථාර කිරීමට යොදාගෙන ඇති තාලය පිළිබඳ අවබෝධය ඉතා වැදගත් කරුණකි. විවිධ තාල අතුරින් අපි පළමු ව එක් විභාගයක් තුළ මාත්‍රා 3 බැගින් අඩංගු වන දාදරා තාලය(මැදුම් තනිතිත/3/4 Beat) අනුව ප්‍රස්ථාර කළ ගීතයක් වාදනය කිරීම පිළිබඳ ව සාකච්ඡා කරමු.

- මාත්‍රා තුනෙන් තුනට විභාග බෙදීම

| | | | |
|---|---|---|---|
| 1 2 3 | 4 5 6 | 7 8 9 | 10 11 12 |

ඉහත දැක්වෙන්නේ විභාග 4කින් යුත් එක් විභාගයක් තුළ මාත්‍රා තුන බැගින් ඇතුළත් ප්‍රස්ථාරයකි. මෙහි ස්වර යොදනු ලබන්නේ 1, 2, 3, 4, 5 ආදී මාත්‍රා යටතේය. කෙටි ඉරි දෙකකින් වෙන් වූ කොටසක් විභාගයක් ලෙස හඳුන්වන අතර සෑම විභාගයක ම අඩංගු වන්නේ මාත්‍රා 3 බැගිනි.

## **<u>ක්‍රියාකාරකම 01</u>**

| | | | |
|---|---|---|---|
| X | X | X | X |
| 1 2 3 | 1 2 3 | 1 2 3 | 1 2 3 |

ඉහත රූපසටහනේ X සළකුණ සෑම විභාගයක ම පළමු මාත්‍රාවට ඉහළින් සටහන් ව ඇති අතර එම සළකුණ ට අත්පුඩිය බැගින් සිදුකරන අතර

| | |
|---|---|
| වන් වූ තී | වන් වූ තී |

අත්තැලීම

යනුවෙන් මාත්‍රා ගණන් කරන්න. මේ සෑම මාත්‍රාවක් අතර ම කාලය එක හා සමාන බව සිහිතබා ගන්න. කිහිපවරක් මෙම ක්‍රියාකාරකම කරන්න.

- පහත දැක්වෙන්නේ මාත්‍රා තුනේ තාලයට ප්‍රස්ථාරයක ඇතුලත් වන ස්වර රටාවන් කිහිපයකි.

| | |
|---|---|
| 1 2 3 | |
| ස ස ස | සෑම මාත්‍රාවක ම එක් ස්වරය බැගින් වාදනය කළ යුතු ය. |

| | |
|---|---|
| ස - ස | පළමු මාත්‍රාව ට වයන ස්වරය නොකඩවා දෙවන මාත්‍රාව අවසන් වන තෙක් වැයීම හා 3මාත්‍රාව ට ස ස්වරය වැයීම |
| ස - - | පළමු මාත්‍රාව ට වයන ස්වරය නොකඩවා තුන්වන මාත්‍රාව අවසන් වන තෙක් වැයීම. |
| + ස ස | පළමු මාත්‍රාව නිහඬ ව සිට 2, 3 මාත්‍රා එක් ස්වරය බැගින් වැයීම. |
| ස ස + | 1,2 මාත්‍රා එක් ස්වරය බැගින් ද තුන් වන මාත්‍රාව නිහඬ ව සිටීම |
| ස + ස | 1 මාත්‍රාව වයා 2මාත්‍රාව නිහඬව සිට 3 මාත්‍රාව වැයීම. |
| සස සස සස | එක් මාත්‍රාවක ට ස්වර 2 බැගින් වැයීම. |

**<u>ක්‍රියාකාරකම</u> 02** ස්වර පුවරුවකින් වාදනය කරන්න.

| | | | |
|---|---|---|---|
| ස ස රි | ග - ග | රි ග - | ස - - |
| ස ස + | ග + ග | රිරි ග රි | ස - - |
| සරි ගරි ගරි | සරි ග+ ගරි | + ග රි | ස - - |
| + ස රි | ග - ග | + සස රි | ග - - |

## <u>ක්‍රියාකාරකම</u> 03

01. මාත්‍රා තුනෙන් තුනට බෙදෙන ගීත 15 ක ලැයිස්තුවක් සකසන්න.
02. **ඔ**බ පෙර වසර වල උගත් මාත්‍රා තුනෙන් තුනට බෙදෙන ගීත වල ස්වර ප්‍රස්තාර ස්වර පුවරුවෙන් වාදනය කරන්න.

**උදා :-** එකට සතුටු සාගරේ

සවන පිනන ගීත මිහිර

නිල් අහස්තලේ

සුවඳ පද්ම